Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කලාප අධ්‍යාපන කාර්යාලය, මාතර.

## සමාජ විද්‍යා තරග - 2018

## 6 ශ්‍රේණිය

**කාලය පැය 1.15**

නම ..........................................................................................

කොට්ඨාසය .............................................. පාසල ..........................................................

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වන පොළොන්නරු ගල් විහාරය නිර්මාණය කළ රජු ලෙස සැලකෙන්නේ කවුද?
(1) පළමුවන පරාක්‍රමබාහු (2) දෙවන පරාක්‍රමබාහු (3) පළමුවන විජයබාහු (4) නිශ්ශංකමල්ල

02. ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන සියල්ල පොදුවේ ගත් කළ හඳුන්වන පොදු නාමය කුමක්ද?
(1) අතීත තොරතුරුය (2) සාහිත්‍ය මූලාශ්‍රය (3) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය (4) මූලාශ්‍රය

03. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයට පමණක් අයත්වන තොරතුරු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පැරණි පොත්පත්, පැරණි ගොඩනැගිලි, මිනිස් ඇටසැකිලි
(2) පැරණි ගොඩනැගිලි, ආහාර ශේෂ, මිනිස් ඇට සැකිලි
(3) පැරණි ගොඩනැගිලි, ශිලා මෙවලම්, පැරණි ලිපි ලේඛන
(4)පැරණි ගොඩනැගිලි, ශිලා මෙවලම්, ලියන ලද ජනකතා

04. ශක වර්ෂ ක්‍රමය ආරම්භ වූයේ කෙසේද?
(1) මුස්ලිම්වරුන් තමන්ගේ ආගමික උත්සව පැවැත්වීමේදී කාලය මැනීම සඳහා
(2) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය සිදුවීම සිහිවීම පිණිස
(3) ගෞතමී සාතකර්ණි රජු ශකවරුන් පරාද කිරීම සිහිකිරීම සඳහා
(4) ශක වංශයට අයත් රජවරුන් රජවීම සිහිවීම පිණිස

05. හිරු උදාවන දිශාවට මුහුණලා දෑත් දෙපසට දිගුකර සිටගත් විට ඔබේ වම් අත විහිදෙන දිශාව කුමක්ද?
(1) උතුර (2) දකුණ (3) නැගෙනහිර (4) බටහිර

06. සුළඟේ වේගය මැනීමට භාවිතාකරන උපකරණය කුමක්ද?
(1) සුළං දිශා දර්ශකය (2) අනිලමානය (3) උෂ්ණත්වමානය (4) වර්ෂාමානය

07. වගාවකට හානිකරන ගොළුබෙල්ලන් විනාශ කිරීම නිසා ගොවියාගේ හිතවතෙක් සේ සැළකෙන සත්වයෙකි
(1) කපුටා (2) මයිනා (3) බත්කූරා (4) ඇට් කුකුළා

08. පාසලක පාලනය හා සම්බන්ධ ප්‍රධාන නිලය කුමක්ද?
(1) කොට්ඨාස අධ්‍යක්ෂ (2) විදුහල්පති (3) නියෝජ්‍ය විදුහල්පති (4) විනය මණ්ඩල ප්‍රධානියා

Sri Lanka's Largest Past Paper Bank - iskolee.com

09. ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයාගත හැකි මූලාශ්‍රයක් **නොවන්නේ** මින් කුමක්ද?

(1) පාසලේ ඇති සමරු එලක (2) ලොග් සටහන් පොත්

(3) විශ්‍රාමික විදුහල්පතිවරුන් හා ගුරුවරුන් (4) මහා වංශය හා දීප වංශය

10. රෝගීන්ට අවශ්‍ය ඖෂධ සහන මිළට ලබාදීමට රාජ්‍ය ඔසුසල ආරම්භ කිරීමට පුරෝගාමී වූයේ කවුද

(1) නන්දදාස කෝදාගොඩ මහතා (2) සේනක බිබිලේ මහතා

(3) සෞඛ්‍ය අමාත්‍යතුමා (4) ජනාධිපතිතුමා

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද ඉදිරියේ වරහනේ යොදන්න.**

11. ලෝකයේ මුලින්ම ජීවීන් බිහිවූයේ ජලයේය. (....
12. මිනිස් වර්ගයා බිහිවීමට බලපෑ මූලික හේතු වූයේ මහා හිම යුගය අවසන් වී ලෝකය උණුසුම් වීමයි.
13. නවශිලා යුගය ආරම්භ වන්නේ මීට අවුරුදු නව දහසකට (9000) පෙර කාලයේදීය. (....
14. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එකතුවීමෙන් පළාතක් සකස් වේ. (....
15. පන්ති කාල සටහන සකස් කිරීම හා ඒ අනුව පංතිවල ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීම ගුරුවරු වගකීමක් වේ. (....

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට සුදුසු නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16. නව ශිලා යුගයේදී ආරම්භ කරන ලද කැපී පෙනෙන වැදගත්ම කටයුත්ත වූයේ ..............................
17. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ........................................................ සාගරයේය.
18. ක්‍රි පූ. 9000 දී එනම් අදට වසර 11000 කට පමණ පෙර වී වගාව ආරම්භ වූයේ ..............................
19. ඔබගේ පාසල දකුණු පළාතේ ........................................ දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
20. ඔබට හිමි අයිතිවාසිකම් භුක්ති විඳිමේදී ඒ හා බැඳි ........................................ ද ඉටුකළ යුතුය.

- **දී ඇති පින්තූර අධ්‍යයනය කර 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

21. (1) යාබද රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

..............................................................................................

(2) මෙසේ නිර්මාණය කර ඇත්තේ කුමකින්ද?

..............................................................................................



22. (1) මෙම මූර්තියෙන් පිළිඹිබු කරන්නේ කවුරුන්ද?

..............................................................................................

(2) මෙය සොයා ගත්තේ කුමන ශිෂ්ටාචාරයෙන්ද?

..............................................................................................



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

23. (1) යාබද රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

..........................................................................................

(2) මෙය අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයටද?

..........................................................................................



24. (1) මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුද?

..........................................................................................

(2) අධ්‍යාපන ක්ෂේත්‍රයට මොහුගෙන් ඉටුවූ වැදගත්ම සේවාව කුමක්ද?

..........................................................................................



25. (1) යාබද රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

..........................................................................................

(2) මෙම උපකරණය මගින් පෙන්නුම්කරන මිනුම් ඒකකය කුමක්ද?

..........................................................................................




- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

26. (1) ලෝකයේ පැරණිම අක්ෂර පද්ධතිය නිර්මාණය කළේ කුමන ශිෂ්ටාචාරයේ වැසියන්ද?

..........................................................................................

(2) මෙසපොතේමියානු සමාජය කොටස් හතරකට බෙදුනි. ඉන් තුනක් සඳහන් කරන්න.

..........................................................................................

27. (1) විජය කුමාරයා මෙරටට පැමිණෙන විට මෙරටෙහි විසූ ජන කොටසක් සඳහන් කරන්න.

..........................................................................................

(2) විජයගේ ඇමතිවරු විසින් පිහිටුවාගත් ගම් තුනක් සඳහන් කරන්න.

..........................................................................................

28. (1) ශාක වලින් ලැබෙන ප්‍රයෝජනයන් සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

(2) ගස්වැල් විනාශ කිරීමෙන් සිදුවන හානි තුනක් සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

29. (1) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනයක් සඳහන් කරන්න.

..................................................................................................

(2) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතනයකින් ඉටුවන සේවාවන් තුනක් සඳහන් කරන්න.

..................................................................................................

..................................................................................................

..................................................................................................

30. (1) පාසල් කොඩිය ඔසවන අවස්ථාවක් සඳහන් කරන්න.

..................................................................................................

(2) පාසල් කොඩිය ඔසවන විට ප්‍රදර්ශනය කළ යුතු ඉරියව් තුනක් සඳහන් කරන්න.

..................................................................................................

..................................................................................................

..................................................................................................

- **අංක 31 සිට 35 තෙක් ස්ථාන සපයා ඇති ලංකාවේ ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න.**

31. මාතර
32. මහනුවර
33. මහවැලි ගඟ
34. ගාල්ල
35. අනුරාධපුරය

